**තවලම ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**-------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 30 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට තවලම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.33,770 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර රු.1,400,000 ක් හා තවලම ආයුර්වේද මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ණයගැති ප්‍රතිපාදනය රු.47,622 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා නව ගොඩනැගිල්ලට විදුලි සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා දරන ලද රු.38,653 ක් හා ගෑස් සිලින්ඩර් 06 ක් මිලදී ගැනීම සඳහා වූ රු.18,000 ක් ප්‍රාග්ධනගත කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට අදාළ රු.55,000 ක් වූ මිණුම් ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දී වෙන්දේසි කරන ලද කැබ් රථයේ පිරිවැය රු.625,000 ක් මෝටර් රථ හා කරත්ත ගිණුමෙන් ඉවත් කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් රු.2,000,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.14,232,468 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂයන් සහ ඊට අදාළ උපයෝගී ලේඛන / ලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු.6,783,736 ක අසමානතා පවතින බව නිරීක්ෂණය විය.

(ii) ස්ථාවර වත්කම් ගිණුම්වල එකතු වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රු.765,691 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම්**

-------------------

වර්ෂ 5 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.16,478 ක අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හඳුනාගෙන ගැලපීම් කර, ගිණුම් නිරවුල් කිරීමට පියවර නොගෙන එම ශේෂය ජංගම වගකීම් වලින් අඩුකර පෙන්වා තිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

(අ) **ලැබිය යුතු ගිණුම්**

-------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය තුළ වූ වර්ෂ 2 සිට වර්ෂ 15 දක්වා කාල පරාසය ඉක්මවූ එකතුව රු.2,979,248 ක් වූ ශේෂ 5 ක් අය කරගෙන නොතිබුණි.

**(ආ)** **ගෙවිය යුතු ගිණුම්**

-------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ ණයහිමි ශේෂය තුළ වර්ෂ 1 සිට වර්ෂ 4 දක්වා වූ එකතුව රු.194,729 ක ශේෂ 03 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

--------------------------------------------------

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

-------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.43,549,185 ක් වූ ගිණුම් විෂයයන් 10 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|---|
| | | රු. | |
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| 134 වන වගන්තිය | | - | බල ප්‍රදේශයේ ඇති දියුණු ප්‍රදේශ හඳුනාගෙන පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව වරිපනම් බදු අයකිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | මුදල් රෙගුලාසි 371(2)(ආ) | 29,403 | වර්ෂ ගණනාවක සිට පැවත එන අත්තිකාරම් 2018 ජුනි වනවිටත් පියවා නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 570 හා 571(1)(2) | 794,786 | තැන්පතු ශේෂ 16 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | | සභාව සතු වාහන 09 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

---

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.529,386 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.1,126,512 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන් තුගත අදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | **2017 දෙසැම්බර් 31 දිනට හිඟ මුදල** | 2016 ඇස්තමේන්තු ගත අදායම | 2016 බිල්කළ ආදායම | 2016 රැස්කළ ආදායම | **2016 දෙසැම්බර් 31 දිනට හිඟ මුදල** |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 363,236 | 281,096 | 320,295 | 430,230 | 258,000 | 177,516 | 350,178 | 469,429 |
| (ii) | කුලී | 81,000 | 87,000 | 63.575 | 64,975 | 81,000 | 87,000 | 77,325 | 41,550 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 122,000 | 122,000 | 25,000 | 101,000 | 40,000 | 40,000 | 36,000 | 4,000 |
| (iv) | වෙනත් ආදායම් | 1,350,000 | - | 1,702,109 | - | 1,254,000 | - | 1,249,384 | - |
| | | 1,916,236 | 490,096 | 2,110,979 | 596,205 | 1,633,000 | 304,516 | 1,712,887 | 514,979 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.1,916,236 ක්වූ අතර බිල්කළ ආදායම රු.490,096 ක් විය. රු.514,979 ක්වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු බිල්කළ ආදායම රු.1,005,075 ක් විය. බිල්කළ ආදායමෙන් රැස්කළ මුළු ආදායම රු.408,870 ක් වූයෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු.596,205 ක් විය.

### 2.2.3 වරිපනම් හා බදු

#### (අ) අක්කර බදු

ආරම්භක හිඟය රු.55,469 ක් වූ අතර, රු.7,296 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සමග රු.62,765 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.2,459 ක් වූයෙන් වර්ෂය අවසානයට රු.60,306 ක හිග ශේෂයක් පැවතුණි.

#### (ආ) වරිපනම් බදු

ආරම්භක හිඟ ශේෂය රු.413,960 ක් වූ අතර රු.273,800 ක්වූ වර්ෂයේ බිල් කිරීම් සමඟ රු.687,760 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.305,700 ක් වූයෙන් වර්ෂය අවසානයට රු.382,060 ක හිඟ ශේෂයක් පැවතුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් උසාවි දඩ වෙනුවෙන් රු.1,499,408 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.2,101,891 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යයසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

පනවා තිබුණු අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබානොගැනීම**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) **ඕපාත සතිපොළ සඳහා ජල පහසුකම් සැපයීම**

පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ රු.134,117 ක් වැයකර නිමකර තිබුණද, 2018 ජූලි 20 දින වනවිටත් සම්පූර්ණයෙන්ම ජල සැපයුම විසන්ධි වී තිබූ අතර, වැඩ විෂයයන් 02 ක් ඉටුකර නොතිබියදී රු.27,058 ක් ගෙවා තිබුණි.

(ii) **ඕපාත උපකාර්යාලයට ජල සැපයුම ලබාදීම**

මෙම ව්‍යාපෘතිය සඳහා රු.118,698 ක් වැය කර තිබුණ ද, 2018 ජූලි 20 දින වනවිටත් ජල පොම්පය සවිකර නොතිබූ අතර, කාර්යාලයට ජල සැපයුම ලබා දී නොතිබුණි. වැඩ විෂයයන් 03 ක් ඉටුකර නොතිබියදී රු.33,837 ක් ගෙවා තිබුණි.

**(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභාවට නිරවුල් අයිතියක් නොමැති ඉඩමක වර්ෂ 3 කට පෙර රු.1,683,125 ක් වැයකර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් වෙනුවෙන් ගොඩනැඟිලි ඉදිකර තිබූ අතර, සමාලෝචිත වර්ෂය වනවිට එම ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි.

(ii) 2017 අප්‍රේල් 20 දිනැති අංක 2015/53 දරන ගැසට් නිවේදනය මඟින් කැළි කසල ඉවත් කිරීම, එක් රැස් කිරීම, ප්‍රවාහනය අත්‍යවශ්‍ය සේවාවක් බවට පත්කර තිබූ අතර, ඒ සඳහා වෙනම ඒකකයක් පිහිටුවා දිගු කාලීන සැලැස්මක් සකස් කළයුතු බව පෙන්වාදී තිබුණද , එවැනි වැඩ පිළිවෙලකට සභාව අවතීර්ණ වී නොතිබුණි.

**(ඇ) පාරිසරික ගැටළු**

-----------------

සභා බල ප්‍රදේශයේ කැළිකසළ එකතු කිරීමක් සිදු නොකරන අතර, බල ප්‍රදේශයේ කසළ අක්‍රමත්ව බැහැර කිරිම නිසා මැසි මදුරු ගහණය වැඩි වී ඇති බව නිරීක්ෂණය විය.

**(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක**

---------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සභාව සකස්කර නොතිබුණි.

## 3.2 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් ද්විතියික හා ප්‍රාථමික පන්තියේ පුරප්පාඩු පිළිවෙලින් 02 ක් හා 08 ක් පැවති අතර, ඒවා සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත සේවකයින් 04 ක් විධිමත් කරගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 180 යටතේ මුදල් හෝ ගබඩා භාරව ක්‍රියාකරන නිලධාරීන් හා ආදායම් එකතු කිරීමේ කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප ලබාගෙන නොතිබුණි.

**(ඇ)** සභාවේ සේවය කර මියගිය, විශ්‍රාම ගිය, වෙනත් ආයතනයකට මාරු වී ගිය හා සේවය හැරගිය සේවකයින් 14 දෙනෙකුගේ එකතුව රු.112,388 ක හිඟ සේවක ණය ශේෂයක් අයනොවී පැවතුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

අංක දපපා/පපාකො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ තුනකට වරක් බදු ගිවිසුම් යාවත්කාලීන කළයුතු වුවද, තවලම පොදු වෙළඳ සංකීර්ණයේ බදු ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

-----------------------------

### 3.4.1 පවරා නොගත් වත්කම්

-------------------------

වාහන 07 ක් සභාවට ලැබී වර්ෂ තුනක් ගත වී තිබුණ ද, එම වත්කම් පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

**3.5 ප්‍රසම්පාදනය**

**-------------**

**3.5.1 කොන්ත්‍රාත් පරිපාලනය**

**--------------------------**

පහත කරුණු නිරීක්ෂණයන් විය.

(අ) ආයුර්වේද ගොඩනැගිල්ලේ සිවිලිමේ කොටසක් ආනයනික දැව යොදා අළුත්වැඩියාව සඳහා රු.116,121 ක් හා ආනයනික දැව සඳහා දැව ආරක්ෂක දෙවරක් ආලේප කර, ඇස්බැස්ටෝස් තහඩු සෙවිලි කිරීමට රු.206,602 ක් ගෙවා තිබුණ ද, සිවිලිම සඳහා ආනයනික නොවන දේශීය දැව යොදා තිබුණි.

(ආ) තවලම පුස්තකාල සංවර්ධන ව්‍යාපෘතියට අදාළ ඇස්තමේන්තුවේ වැඩ විෂයය 02 ක් වෙනුවෙන් රු.11,635 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**-----------------------------------------**

**4.1 අයවැය පාලනය**

--------------------

සමාලෝචිත වර්ෂය සඳහාවූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) වියදම් විෂයයන් 05 ක රු.10,431,294 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම වටිනාකම් සියයට 19 සිට සියයට 71 දක්වා පරාසයක පැවතුණි.

(ආ) එක් වියදම් විෂයයක අහිතකර විචලනය රු.633,382 ක් වූ අතර, එම වටිනාකම සියයට 227 ක් විය.

(ඇ) ආදායම් විෂයයන් 06 ක අහිතකර විචලන්ගේ එකතුව රු.19,917,678 ක් වූ අතර, එම වටිනාකම සියයට 8 සිට සියයට 61 ක දක්වා පරාසයක විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

-------------------------

දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

-------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | (i) | ඉකුත් වර්ෂවල සිට ඉදිරියට එන ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| | (ii) | ගිණුම් හා ඊට අදාළ උපලේඛන අතර, පවතින වෙනස්කම් නිවැරදි නොකිරීම. |
| (ආ) ස්ථාවර වත්කම් | (i) | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව නඩත්තු නොකිරීම. |
| | (ii) | ඉඩම්වල අයිතිය හඳුනා නොගැනීම. |
| (ඇ) වාහන පාලනය | (i) | වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට කටයුතු නොකිරීම. |
| | (ii) | වාහනවල අයිතිය පවරා නොගැනීම. |
| (ඈ) ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොකිරීම. |
| | (ii) | කඩබදු ගිවිසුම් යාවත්කාලීන කර නොතිබීම. |
| (ඉ) සේවක මණ්ඩල කළමනාකරණය | (i) | කාර්ය මණ්ඩල විධිමත් කර නොතිබීම. |
| | (ii) | හිඟ ණය ශේෂ අයකර නොගැනීම. |